# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ)

**ආලෝකා සමාජ සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්. එම්. මරික්කාර් මහතා විසින්
2016 සැප්තැම්බර් මස 21 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 අගෝස්තු මස 29 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

[138 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 11.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ)

## ආලෝකා සමාජ සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

''ආලෝකා සමාජ සේවා පදනම'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනම, එකී පදනමේ සාමාජිකයින් එකඟ වූ රීති අනුව, එකී පදනම සම්බන්ධ සියලුම පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබුණු හෙයින් ද: පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එම පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

1. මේ පනත 2016 අංක      දරන ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ආලෝකා සමාජ සේවා පදනම සංස්ථාගත කිරීම.

2. (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) "ආලෝකා සමාජ සේවා පදනම" දැනට සාමාජිකයන් වශයෙන් සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ආලෝකා සමාජ සේවා පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් සහ ඒ සංස්ථාව විසින් පොදු මුද්‍රාවක් තබා ගැනීමේදී ද, පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය එකී සංස්ථාවට තිබිය යුතු ය.

(2) සංස්ථාව, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එකී කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එම පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) කොළඹ දිස්ත්‍රික්කයේ වෙසෙන පොදු ජනතාවගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලන අභිමතාර්ථයන් මුදුන් පමුණුවා උසස් ජීවන මට්ටමක් සහිත පොදු ජනතාවක් බිහි කිරීම;

(ආ) කොළඹ දිස්ත්‍රික්කයේ වෙසෙන තරුණ තරුණියන්ගේ කලා කුසලතා හා දැනුමෙහි වැඩි දියුණුව ළඟාකර ගැනීම සඳහා මාර්ගෝපදේශකත්වය ලබා දීම;

(ඇ) විශේෂයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ වෙසෙන අ.පො.ස. (සා.පෙළ) සමත් හා අසමත් වයස අවුරුදු 15 - 29 අතර වයස් කාණ්ඩයේ යෞවනයන් හෝ විරැකියාව දුරලීම පිණිස තිරසාර පිළියම් වෙනුවෙන් කටයුතු කිරීම මෙම ප්‍රඥප්තියෙන් ඉඩ සැලසේ;

(ඈ) කොළඹ දිස්ත්‍රික්කයේ වෙසෙන යෞවන යෞවනියන්ගේ පොදු අභිවෘද්ධිය, ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලන අභිමතාර්ථයන් මුදුන් පැමිණවීමේ කාර්යය සඳහා අවශ්‍ය වන මූලෝපායන් හඳුනාගැනීම හා ඒවා පරමාර්ථ සඳහා යොදා ගැනීම;

(ඉ) කොළඹ දිස්ත්‍රික්කයේ වෙසෙන ජනතාවගේ යටිතල පහසුකම් නංවාලීම සඳහා අදාළ සියලුම රාජ්‍ය ආයතනවල සේවාවන් සම්බන්ධීකරණය කිරීම හා එම ව්‍යාපෘති යෝජනා අදාළ ආයතන වෙත යොමු කිරීම;

(ඊ) කොළඹ දිස්ත්‍රික්කයේ වෙසෙන ජනතාවගේ සංවර්ධනයට අවශ්‍ය මුලාධාර හා සංවර්ධන ව්‍යාපෘතීන් ඵලදායී ලෙස යෙදවීම හා එම ක්‍රියාදමයන් අඛණ්ඩ පසු විපරමට ලක්කිරීම හා එහි අවසන් ඉලක්ක සඳහා මෙහෙයවීම;

(උ) කොළඹ දිස්ත්‍රික්කයේ වෙසෙන ජනතාව අතර වාර්ගික, ආගමික හා සංස්කෘතීන්වල වර්ධනය හා සහජීවනය වෙනුවෙන් කටයුතු කිරීම;

(ඌ) කොළඹ දිස්ත්‍රික්කයේ වෙසෙන අඩු ආදායම්ලාභී පවුල් හඳුනාගැනීම හා ඔවුන්ගේ දෛනික ගෘහ ආදායම ඉහළ දැමීමට අදාළ වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම තුළින් ඔවුන්ගේ ජීවන රටාව ධනාත්මක වෙනසකට ලක් කිරීම;

(එ) කොළඹ දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් සඳහා අන්තර්ජාල පරිහරණයේ නිවැරදි මාවත පෙන්වා යොමුකර, ලෝකය සමඟ නිවැරදි ලෙස තරග කළ හැකි නව තාක්ෂණයෙන් පිරිපුන් තරුණ පරපුරක් බිහි කිරීම;

(ඒ) කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවගේ ව්‍යවසායකත්වය සම්බන්ධයෙන් කුසලතා හා හැකියාවන් ද, ව්‍යාපාර, තාක්ෂණය සහ කළමනාකරණය සම්බන්ධයෙන් පර්යේෂණ හා පුහුණු කිරීම මෙන්ම ආදායම් උපදවන සහ ස්වයං සේවා නියුක්ති ව්‍යාපාර පිළිබඳ සංකල්ප වැඩි දියුණු කිරීම, සංවර්ධනය කිරීම, පෝෂණය කිරීම සහ පවත්වාගෙන යාම.

(2) (1) වන උප වගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, එකී පරමාර්ථ වර්ගය, ආගම, භාෂාව, කුලය. ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත පදනම් කරගත් වෙනස්කමකට භාජනය නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට සංස්ථාව විසින් වගබලා ගත යුතු ය.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක, අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමඟ සංස්ථාවේ කාර්ය ගැටුම් සහගත නොවන බවට සංස්ථාව වගබලා ගත යුතු බව.

**4.** ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්ය අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මෙම පනතේ (7) වන උප වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති මගින් විනිශ්චය කරනු ලැබිය හැකි ධුර දරන්නන් මෙම පනතේ (8) වන උප වගන්තිය යටතේ ඇති යම් සංඛ්‍යාවකින් සමන්විත විධායක සභික මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරනු ලැබූ පදනමේ විධායක මණ්ඩලය, (7) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම මණ්ඩලය පත් කරනු ලබන හෝ තෝරා පත් කරනු ලබන තෙක්, සංස්ථාවේ විධායක සභික මණ්ඩලය වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරු සහ උපදේශකවරු ද ඇතුළුව මණ්ඩලයේ සෑම ධුර දරන්නකුම වර්ෂ පහක කාලයක් සඳහා පත් කර ගත යුතු හෝ තෝරා පත් කර ගත යුතු අතර, ඒ වර්ෂ පහක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව ඒ ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(ආ) වරක් බලයේ සිටි විධායක සභික මණ්ඩලයක් නැවත වාරයක් පත් කර ගැනීමට හෝ අහෝසි කොට නව ක්‍රියාකාරී කමිටුවක් පත් කර ගැනීමට හෝ වෙනස් කිරීමට ගරු අනුශාසකවරයාගේ උපදෙස් මත සභාපතිවරයාට පූර්ණ බලය ඇත.

(ඇ) යම් ධුර දරන්නකු මිය යාම, ඉල්ලා අස්වීම, නොහැකියාවකට පත් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරයේ පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, විධායක සභික මණ්ඩලය විසින් සංස්ථාවේ

රීති සැලකිල්ලට ගෙන ඒ පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත් කර ගත යුතු හෝ පත් කර ගත යුතු ය. මේ සඳහා අනුශාසකවරුන්ගේ උපදෙස් මත සභාපතිවරයාට බලය පවතී.

(ඈ) (ඇ) ඡේදය යටතේ තෝරා පත් කර ගනු ලබන හෝ පත් කර ගනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

සංස්ථාවේ බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා සහ කාරණා කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ බලය සංස්ථාවට තිබිය යුතු ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට, අලුත්වැඩියා කිරීමට සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇති සුදුසු යැයි සැලකෙන අයුරින් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම සහ රැස් කිරීම සඳහා මුදල් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාව වෙත ලබාදෙනු ලබන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලය විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීමට, ලිවීමට, භාර ගැනීමට වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිළට ගැනීමට, විකිණීමට සහ නිකුත් කිරීමට සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් විධායක සභික මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකින් ආයෝජනය කිරීම;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇති යම් නීත්‍යනුකූල භාරයක් හෝ නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඊ) සංස්ථාවේ නිලධාරින් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලැබිය හැකි වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීමට;

(උ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(ඌ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය අනෙකුත් ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම;

(එ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන් හි දී සේවක පිරිස් පුහුණු කිරීම; සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු දේ සිදු කිරීම.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාව විසින්, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන්නා වූ රීති, පහත සඳහන් සියලු කරුණු හෝ ඉන් කිසිවක් සඳහා කලින් කළ සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) විධායක සභික මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත් කිරීම් නියම සහ කොන්දේසි, බලතල, කර්තව්‍ය හා කාර්ය;

(ඈ) මණ්ඩලයේ හෝ අනුකමිටුවල රැස්වීම් කැඳවීම්, රැස්වීම් පැවැත්වීම, එවැනි රැස්වීම්වල දැන්වීම් හා න්‍යාය පත්‍ර, ගණපූරණය සහ රැස්වීම්වල කාර්ය මෙහෙයවීම් සම්බන්ධයෙන් වන ක්‍රියා පටිපාටිය;

(ඉ) සංස්ථාවේ සහ විධායක සභික මණ්ඩලයේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) පොදුවේ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන්, එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම කල්හි ම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

**විධායක සභික මණ්ඩලය සහ සාමාජිකයන්ගේ සාමාජික ලේඛනය.**

**8.** ආලෝකා සමාජ සේවා පදනමේ විධායක සභික මණ්ඩලය පහත සඳහන් තනතුරුවලින් සමන්විත වේ. අනුශාසක, සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, සංවිධායක, උප සභාපති, උප ලේකම්, උප භාණ්ඩාගාරික සහ විධායක සභික, තව ද සාමාජිකයන්ගේ නම්, ලිපින සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජිකයන්ගේ ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

**සංස්ථාවේ අරමුදල.**

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලුම මුදල්, විධායක සභික මණ්ඩලය විසින් අනුමත කරන ලද එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන යම් වියදම් පියවීමට අවශ්‍ය සියලුම මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**ගිණුම් සහ විගණනය.**

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම, ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක, එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව.

**11.** (1) මණ්ඩලය විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහාම සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග ඒ වාර්තාව අදාළ වන වසරට පසුව එන වර්ෂයේ සහ මාසයක් ඉකුත් වීමට පෙර සමාජ සේවා විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරණ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාව වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙන ගිණුමක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග යැවිය යුතු ය.

පදනම විසින් ගෙවිය සහ පදනමට ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය මුදල්.

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතු සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියළු ණය සහ පදනමට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දයක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**13.** යම් මිලට ගැනීමක්, ප්‍රදනයක්, ත්‍යාගයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියළු දේපළ දැරිය යුතු ය.

*මුදල් සහ දේපළ අදාළ කර ගැනීම.*

**14.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාවේ මුදල් හා දේපළ, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදාළ කර ගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් සංස්ථාවේ සාමාජිකයින් ලාභාංශ මුදල්, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් ඍජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව.*

**15.** (1) මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව, කිසිම සාධන පත්‍රයක තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටින බවට සළකුණ වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි මණ්ඩලයේ යම් ධුර දරන්නකුගේ භාරයේ තැබිය යුතු ය.

*විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.*

**16.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලුම ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබේ. මෙම සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදයමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් මණ්ඩලයේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

*ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.*

**18.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.